# භාෂා සමර්පණය සහ සාවද්‍යතා විශ්ලේෂණය: විදේශ භාෂාවක් ඉගෙනීම පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක් (ප්‍රංශ භාෂාව ඇසුරෙන්)

ඩී. ඒ. එස්. ඩී. දයාරත්න

## සංක්ෂිප්තය

පුද්ගලයෙකුට විදේශ භාෂාවක් නිතැතින්ම ග්‍රහණය කර ගැනීමේ හැකියාව විරල වන අතර බොහෝවිට ක්‍රමානුකුල අධ්‍යාපනයක් හරහා විදේශ භාෂාවක් උගැන්මට සිදුවේ. එසේ විදේශ භාෂාවක් ඉගෙනගැනීමේදී, පුද්ගලයාගේ භාෂා හැකියාව සහ භාෂා මට්ටම විවිධ නිර්ණායක ඔස්සේ පරීක්ෂණයට භාජනය කළ හැක. 'සාවද්‍යතා විශ්ලේෂණය' සහ 'භාෂා සමර්පණය' විදේශ භාෂාවන් ඉගෙනීමේදී හා උගැන්වීමේදී භාවිත කළ හැකි සාර්ථක ආදර්ශ දෙකකි. විදේශ භාෂාවක් ඉගෙනීමේදී ඇතිවන සාවද්‍යතාවලට මූලික හේතුව වන්නේ මව් භාෂාවේ හෝ දෙවන භාෂාවක ආවේණික හා පොදු ලක්ෂණවල බලපෑම (භාෂා සමර්පණය) විදෙස් භාෂාවක් උගෙනීමේදී ඍජු ලෙසම ඍණාත්මකව බලපෑමය. විදෙස් භාෂාවක් ලෙස ප්‍රංශ භාෂාව හදාරන ශ්‍රී ලංකේය සිසුන්ගේ මූලික සරල වාක්‍ය රචනා හා නීති තුළ හමුවන එවන් වූ පොදු සාවද්‍යතාවන් අධ්‍යයනය හා විශ්ලේෂණය හරහා ඒවායේ මූල බීජයන් සහ එම සාවද්‍යතාවලට මුල්වන හේතු හඳුනා ගැනීම මෙම අධ්‍යයනය තුළින් බලාපොරොත්තු වූ අතර සාවද්‍යතා විශ්ලේෂණයේ උපන්‍යාස දෙකක් වන 'භාෂා දෙකක් අතර ව්‍යුහයේ ඇති වෙනස්කම් අදාළ ඉලක්ක භාෂාව ඉගෙනීමේදී මුහුණපෑමට සිදුවන අසීරුතාවයන් සඳහා බලපායි' යන්නෙහි හා 'භාෂා දෙකක් අතර ව්‍යුහයේ ඇති සමානකම් අදාළ ඉලක්ක භාෂාව ඉගෙනීමේදී මුහුණපෑමට සිදුවන අසීරුතාවයන් සඳහා හේතුවේ' යන්නෙහි සත්‍යාසත්‍යතාව පර්යේෂණයට බඳුන්කිරීම මෙමගින් අපේක්ෂා කෙරිණි. එසේම එසේ හඳුනාගත්තා වූ සාවද්‍යතා සහ භාෂා සමර්පණ අවස්ථා හරහා වඩා ඵලදායි සහ ප්‍රායෝගික ලෙස ප්‍රංශ භාෂාව ඉගැන්වීමේ ක්‍රමවේදයක් සකස් කිරීම මෙම පර්යේෂණයේ තවත් මූලික අරමුණක් විය.

පර්යේෂණයේ ක්‍රමවේදය වශයෙන් වසරක් පුරා සිසුන්ගේ නිදහස් භාෂා මාධ්‍යයන් වන රචනා, පරිවර්තන, භාෂණ හා වෙනත් නිර්මාණාත්මක ලිපි නියැදි ලෙස යොදාගත් අතර ප්‍රශ්නාවලි හරහා අනෙකුත් අදාළ තොරතුරු සහ අදහස් ලබාගන්නා ලදී. සිසුන්ගේ සාවද්‍යතා විශ්ලේෂණය හරහා නිරීක්ෂණය කරන්නට හැකි වූ මූලික කරුණු කිහිපයකි. ඒ අතරින් විවිධ වූ නාම විශේෂණ, කාල භේද, වරනැඟීම් ආශ්‍රිත භාෂා භාවිතයන්හි දෙවන භාෂාවේ (ඉංග්‍රීසි) බලපෑම් හෙවත් භාෂා සමර්පණයන් දක්නට ලැබුණි. සිසුන් භාෂාව හදාරන එක්තරා සංක්‍රාන්තික කාලසීමාවක් තුළ පමණක් එම සාවද්‍යතා නිරීක්ෂණය කරන්නට හැකි වූ අතර ඉගැන්වීමේ ක්‍රියාවලියේදී පැහැදිලි ලෙස භාෂාවේ ඇති වෙනස්කම් පහදා දුන්න ද භාෂාව යම්තරමකට ප්‍රගුණ කරන තාක් සුළු වශයෙන් හෝ එවැනි සාවද්‍යතා නිරීක්ෂණය කරන්නට ලැබිණි. එසේම ඒවා සිසුන්ගේ අභිප්‍රේරණය, භාෂා නැඹුරුව, දැනුම, ඉගෙනුම් කාලය හා බුද්ධිය යන සාධක මත ද තීරණය විය. එසේම උපන්‍යාසයේ ගොඩනැංවූ තර්ක දෙකෙහිම කරුණු අඩු වැඩි වශයෙන් දක්නට ලැබුණි. එසේම ඉගැන්වීමේ ක්‍රියාවලියේදී කටපාඩම් කරවීම, ආදර්ශ පුහුණු කිරීම සහ විශාල වශයෙන් අභ්‍යාසවල යෙදවීමට වඩා අදාල සාවද්‍යතා පෙන්වාදීම මගින් හා එහි නිවැරදි වාක්‍ය සැලැස්ම පැහැදිලිව අවධාරණ කිරීම තුළින් ඉතා සාර්ථක ඉගැන්වීම් ක්‍රියාවලියක් ගොඩනැංවියහැකි බව මෙම පර්යේෂණය තුළින් හෙළිදරව් විය.

**යොමු වචන** :- මව් භාෂා උපාර්ජනය, දෙවන භාෂා ඉගෙනීම, විදේශ භාෂා ඉගෙනීම හා ඉගැන්වීම, සාවද්‍යතා විශ්ලේෂණය, භාෂා සමර්පණය